# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1685/18 - 2010 දෙසැම්බර් 23 වැනි බ්‍රහස්පතින්දා - 2010.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝග

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය, රිෂාඩ් බදුයුදීන් වන මම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, යථෝක්ත පනතේ 14 (1) වැනි වගන්තිය යටතේ 2010 නොවැම්බර් මස 22 වැනි දිනැති අංක 1681/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද නියමයන්, එකී නියමයන්ට වූ උපලේඛනයෙහි දැක්වෙන, පහත සඳහන් භාණ්ඩ ඉවත් කිරීම මඟින් සංශෝධනය කරනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

රිෂාඩ් බදුයුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2010 ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I*<br>*සං.ව. ශීර්ෂය* | *II*<br>*සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *III*<br>*විස්තරය* | *IV*<br>*සෙස් බදු ප්‍රමාණය* |
|---|---|---|---|
| 08.01 | | අලුත් හෝ වියළි, පොතු ගැල වූ හෝ නොගැල වූ හෝ ලෙලි ගැසූ හෝ නො ගැසූ, පොල්, බ්‍රසීල ගෙඩි සහ කජු ගෙඩි | |
| | 0801.19 | අනෙකුත් : | |
| | 0801.19.10 | ලෙලි ගැසූ හෝ කොටසක් ලෙලි ගැසූ | ඒකකයට රු. 4.00 |

01—230/1

1A - G 13994—930 (2010/12)

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝග

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2010 දෙසැම්බර් මස 25 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි, මෙහි උපලේඛනයේ III වැනි තීරුවේ දක්වා ඇති භාණ්ඩ අපනයනය කිරීම මත, එකී උපලේඛනයේ IV වැනි තීරුවේ ඒ සඳහා දක්වා ඇති අදාළ අනුප්‍රමාණ පරිදි, සෙස් බද්දක් නියම කොට, අයකරගත යුතු බව මෙම නියෝගය මඟින් ප්‍රකාශයට පත් කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2010 ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I* *සං.ව. ශීර්ෂය* | *II* *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *III* *විස්තරය* | *IV* *සෙස්බදු ප්‍රමාණය* |
|---|---|---|---|
| 08.01 | | අලුත් හෝ වියළි, පොතු ගැල වූ හෝ නොගැල වූ හෝ ලෙලි ගැසූ හෝ නො ගැසූ, පොල්, බ්‍රසීල ගෙඩි සහ කජු ගෙඩි | |
| | 0801.19 | අනෙකුත් : | |
| | 0801.19.10 | ලෙලි ගැසූ හෝ කොටසක් ලෙලි ගැසූ | ඒකකයට රු. 30.00 |

01—230/2